# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,270 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 314 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 316 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 මාර්තු මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


313- B 082321 — 353 (2022/03)
D 1 -

# පිස්කල් විකිණීම්

## ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියයි

### කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

නඩු අංකය - CHC 212/16 MR.

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
ගාලු පාර, කොළඹ 03.

...................*පැමිණිලිකරු.*

*එදිරිව*

..................*විත්තිකරුවන්.*

1. මාමුණ්ඩි ප්‍රභාහරන්, 112/8, වැලිඅමුණ පාර, හැඳල, වත්තල.
2. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, 68, බෞද්ධාලෝක මාවත, කොළඹ 04.
3. සින්නතම්බි රාජේන්ද්‍රන්, 65/ 378, කාක දූපත, විස්ට්මන්ට් පාර, කොළඹ 15.

වර්ෂ 2020ක්වූ ජූනි මස 19 වන දින ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත නම් කර ඇති 01 වන විත්තිකරු විසින් පැමිණිලිකරුට රු. 5,037,286/- ක මුදල හා ප්‍රධාන ණය මුදල මත වර්ෂයකට 23%ක් බැගින් වූ පොළියක් ද, හිඟ තබන ලද වාරික මත මසකට 5%ක් දඩ පොළිය සහ ඒ අනුව තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා ඉහත සඳහන් පොළිය සහ තීන්දු ප්‍රකාශයේ දින සිට මුලු මුදල මත නෛතික පොලිය අයකර ගැනීමටත්, නඩු ගාස්තු අයකර ගැනීමටත්ය. තවද 'P4' දරන උකස්කරය මත පැමිණිලිකාර සමාගමට උකස්කර කර ඇති පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් දේපළ සම්බන්ධයෙන් උකස් පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකල හැකි බවටද තීන්දු ප්‍රකාශ කරන ලදී.

එම ඉඩම හා පරිශ්‍රය තක්සේරු වටිනාකමට විකිණීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කිරීමටත්, එම තක්සේරු වටිනාකම මිලදී ගැනීම සඳහා ලංසු තබන්නන් නොමැති වුවහොත් කොමිසම නිකුත් කරන අවස්ථාවේදී තීන්දු ප්‍රකාශය යටතේ අයවිය යුතු මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම විකිණීමේ දී ලංසුකරුවන් නොමැති වුවහොත් ඉන් අනතුරුව ඉහළම ලංසුකරුට හෝ ලංසුකරුවන්ට විකිණීම සඳහාත් බලය දෙන ලෙස ආඥා කොට ප්‍රකාශ කරන ලදී. එම ඉඩම් පරිශ්‍රය තක්සේරු වටිනාකමට විකිණීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කිරීමට උකස් පනතේ 52 (1) වගන්තිය යටතේ නියමයක් කර තිබෙන අවස්ථාවක එම පළමු විකිණීමේදී ඉදිරිපත් වූ ඉහළම ලංසුව උකස් පනතේ 51 (3) වගන්තිය යටතේ නියම කරනු ලැබූ තක්සේරු වටිනාකමට වඩා අඩුවුවහොත් එම ඉඩම ප්‍රථම විකිණීමේ දී නොවිකිණිය යුතු බවට සහ එවැනි අවස්ථාවක එම ඉඩම දෙවන වරටද විකිණීමක් කළ යුතු බවට සහ එම දෙවන විකිණීමේදී ද එම තක්සේරු වටිනාකමට මිලදී ගැනීම සඳහා ගැණුම්කරුවන් නොමැති වුවහොත් කොමිසම නිකුත් කළ අවස්ථාවේ අයවිය යුතුව තිබුණු මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම විකිණීමේදී ද ලංසුකරුවන් නොමැති වුවහොත් ඉන් අනතුරුව උකස් පනතේ 50 (4) වගන්තියට අනුකූලව ඊළඟ ඉහළම ලංසුකරුට හෝ ලංසුකරුවන්ට විකිණීම සඳහා ඉදිරිපත් කිරීමටත් ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එකී ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීම සඳහා ලංසු තැබීමට පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තෙකුට ඉඩ දීමට හා පැමිණිලිකරු ගැණුම්කරු බවට පත්වුවහොත් පැමිණිලිකරුගේ හිමිකම්පෑමේ හා ගාස්තුවල ප්‍රමාණය දක්වා පැමිණිලිකරුට බැරවාසි දීමටත් ආඥාකොට තීන්දු ප්‍රකාශ කරන ලදී. එම විකිණීමේ ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් විකුණුම් කොන්දේසි අනුව ක්‍රියාකල පසුව ගැණුම්කරු පැමිණිලිකරු නම් පැමිණිලිකරුට ඉඩහරින ලද බැර වාසිය අනුමත කරන අධිකරණ ආඥාවක් ඉදිරිපත් කල පසුව හා ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් තුන්වන පාර්ශවයන් හෝ පාර්ශවකරුවන් වේ නම් ඔවුන් විසින් ගැණුම් මිල නිසි පරිදි අධිකරණයේ තැන්පත් කර තිබෙන බවට අධිකරණ ආඥාවක් හෝ අධිකරණ ආඥා ඉදිරිපත් කල පසුව ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් නමට නීතිය අනුව නිසි ආකෘතියෙහි වූ පැවරුම්කරයක් හෝ පැවරුම්කර ලියා අත්සන් කර දීමටත් පිස්කල්වරයාට/ වෙන්දේසිකරුට නියම කර බලය දෙන ලෙස ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී. ඉහත කී පරිදි විකුණනලද උකස් දේපලෙහි නිරවුල් හා හිස් සන්තකය එය මිලදී ගත් ගැණුම්කරුට හෝ ගැණුම්කරුවන්ට භාරදෙන මෙන් පිස්කල්වරයාට විධාන කරන ලෙස තීන්දු ප්‍රකාශ කරන ලදී. විකිණීමෙන් ලැබෙන මුදල් පැමිණිලිකරුගේ හිමිකම්පෑම පොළිය සහ ගාස්තු ගෙවීම සඳහා යොදන ලෙස ආඥා කොට තීන්දු ප්‍රකාශ කරන ලදී.

අධිකරණය විසින් නම් කරනු ලැබූ ආඥාවකදී හැර මේ අධිකාරය ක්‍රියාවේ යෙදවීම නොනවත්වන ලෙස මෙයින් වැඩිදුරටත් විධානය කරනු ලැබූ හෙයින්, එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති විකිණීම සඳහා වූ අධිකාර පත්‍රයේ බලය පිට මා විසින් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල වූ පර්චස් දහනවයයි දශම හයයි පහක් (පර්. 19.65) වූ ''හැඩවකගහකුරුදූවත්ත'' යනුවෙන් හඳුන්වන ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ වර්ෂ **2022 ක් වූ මාර්තු මස 25 වැනි දින ප.ව. 1.00ට** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*දේපලට පිවිසීම.-*

කොළඹ හෙට්ටියාවත්ත මංසන්ධියේ සිට අලුත් මාවත පාර ඔස්සේ මෝදර හේමාස් ගබඩාව පසුකර යන විට හමුවන සුරංජිත් ට්‍රේඩ් සෙන්ටර් අසලින් වමට හැරී ඉදිරියට යන විට දකුණට හමුවන කේ. ජී. පාර ඔස්සේ මීටර් 50ක් ඉදිරියට යන විට දකුණු දෙසින් ඇති වාසනා මාවත ඔස්සේ මීටර් 15ක් පමණ ගියපසු වම්පසින් ඇති දුඹුරු පැහැති වානේ ගේට්ටුව සහිත නිවස.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. (චෙක්පත් භාර ගනු නොලැබේ.)

1. විකුණුම් මිලෙන් 25% (සියයට විසිපහක්)
2. වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු (ගැණුම් මිලෙන්) 2.5% (සියයට දෙකයි දශම පහයි)
3. සියලුම ප්‍රචාරක ගාස්තු
4. මුද්දර ගාස්තු
5. ලිපිකරු හා සෝෂක ගාස්තු
6. ප්‍රාදේශීය සභා ගාස්තු 1% (සියයට එකක්)
7. නොතාරිස් ගාස්තු
8. පළාත් පාලන ආයතන විසින් පනවනු ලැබූ වෙනත් බදු ද ආදිය
9. ගැණුම් මිලෙන් පලමුවන රු. 7,500/-ට රු. 150/- ක් ද ඊට අමතරව ලැබෙන සෑම රු. 1,000/- ට ම රු.5/- බැගින් වූ අධිකරණයට ගෙවිය යුතු ගාස්තු ද, ඉතිරි 75%ක (සියයට හැත්තෑපහක්) මුදල දින 30ක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු අංක CHC 212/16 MR දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු අතර එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් මුලින් තැන්පත් කරන ලද මුදල් ආපසු නොගෙවන අතර එකී දේපල නැවත වෙන්දේසියේ තැබීමට ක්‍රියා කරනු ඇත.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ දකුණු අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාල සීමාව තුළ අංක 170, තිඹිරිගස්යාය ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ හැඳල පිහිටි වැලි අමුණ පාර, හැඳල වරිපනම් අංක 122/1 දරන හැඩවකගහකුරුදූවත්ත කියන ඉඩමෙන් කේ. එම්. සමරසිංහ බලයලත් මානක තැන විසින් 1968/11/20 වැනි දින මැන සාදන ලද අංක 1536 දරන පිඹුරට අනුව එකී පිඹුරේ සඳහන් ලොට් 3 දරන කොටස වන උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 4 සහ වැලන්ටින් ඩයස්ගේ උරුමකරුවන්ට අයිති දේපල ද, දකුණට : ඩී. එම්. ජේ. කොරයා යන අයට අයිති දේපලද, බස්නාහිරට : ලොට් 2 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම තුනයි පහක් (පර්. 19.35) ක් විශාල ඉඩමේ බිම් සහ ඊට අයත් සියලු දේද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් අංක B 930/238 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී බලයලත් මිනින්දෝරු කේ. එම්. සමරසිංහ මහතාගේ අංක 1536 සහ 1968/11/20 දිනැති පිඹුරේ ලොට් 3 දරන ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු හියුඩ් ආර්. සමරසිංහ මහතා විසින් මෑතකදී කරන ලද අංක 3947 සහ 2004/03/25 දිනැති පිඹුර අනුව පහත සඳහන් ලෙස විස්තර වේ.

බලයලත් මිනින්දෝරු හියුඩ් ආර්. සමරසිංහ මහතාගේ අංක 3947 සහ 2004/03/25 දිනැති පිඹුරේ ලොට් 01 දරන කොටස,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ දකුණු අලුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාල සීමාව තුළ අංක 170, තිඹිරිගස්යාය ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ හැඩවකගහකුරුදූවත්ත කියන ඉඩමෙන් කේ. එම්. සමරසිංහ බලයලත් මානක තැන විසින් 1968/11/20 වැනි දින මැන සාදන ලද අංක 1536 දරණ පිඹුරට අනුව එකී පිඹුරේ සඳහන් සහ කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ පිහිටි (ලොට් අංක 3 දරන ඉඩම් කොටස නැවත මැනීමක් වන) ඉඩම් කොටසට මායිම් - උතුරට : පාර ද, නැගෙනහිරට : ඉහත කී අංක 1536 දරන පිඹුරේ ලොට් 4, ඇන්ටන් ප්‍රනාන්දු සහ මනෝජනී රොෂානි පෙරේරා යන අයගේ ඉඩම්ද, දකුණට : එම්. සී. පීටර්ට අයත් ඉඩමද සහ බස්නාහිරට : ඉහත කී

1536 දරන පිඹුරේ ලොට් 2 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයයි දශම හයයි පහක් (පර්. 19.65) ක් විශාල ඉඩමේ බිම් සහ ඊට අයත් සියලු දේද වේ.

අධිකරණයේ අණ පරිදි,

අජිත් දසනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් තක්සේරුකරු හා වෙන්දේසිකරු.

විමසීම හා අදාල ඔප්පු ලේඛන පරීක්ෂාව සඳහා හමුවන්න.

දු. ක. : 072 - 1802348/ 011- 2549428

03-49

---

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ)

නුගේගොඩ, නාවල පාරේ, විජයබා මාවත, අංක 24, 10B, 1/1 දරන ස්ථානයෙහි සිය ලියාපදිංචි කාර්යාලය ඇති ප්‍රයිම් ෆාමා ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් පිළිබඳ කාරණාවෙනි. (පීවී 13051) සම්බන්ධ කාරණාවේ දී.

නඩු අංකය : සීඑච්සී/86/21/සීඕ.
ස්වභාවය : ගණන් බේරා ඇවර කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 270(a) සහ (f)XII වැනි වගන්ති යටතේ සහ ඒ අනුව ගණන් බේරා ඇවර කිරීම සඳහා වන ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී ය.

ප්‍රයිම් ෆාමා ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
අංක 24, 10 B, 1/1,
විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ.

......................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් පෙත්සම්කරු වන අංක 24, 10 B, 1/1, විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ ලියාපදිංචි කාර්යාලය පිහිටි ප්‍රයිම් ෆාමා ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් 2021 නොවැම්බර් මස 23 වැනි දින ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී පැවැත්වෙන බස්නාහිර පළාත් මහාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවට මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පෙත්සම 2022.03.28 වැනි දින ඇසීමට නියම කර ඇති අතර, එම පෙත්සම සම්බන්ධයෙන් සහයෝගය දැක්වීමට හෝ ඒ සඳහා විරුද්ධතාවය දැක්වීමට කැමති එම සමාගමෙහි කිසියම් ණයහිමියකු හෝ දායකයකු සිටී නම් එය අඩගසනු ලබන දිනයේදී තම නීති උපදේශකයා හෝ ලියාපදිංචි නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටීමට හැකි අතර, පෙත්සමෙහි පිටපතක් ලබාගැනීමට කැමති ණය හිමියෙකු හෝ එකී සමාගමේ දායකයෙකු සිටී නම්, ඒ සඳහා නියමිත ගාස්තු ගෙවීමෙන් එය පහත අත්සන් තබන අය විසින් සපයනු ඇත.

පෙත්සම්කරුගේ ලියාපදිංචි නීතිඥ,
ලක්ෂිකා රත්නායක ඇසෝසියේට්ස්,
අංක 16/2/1, පරණ කොට්ටාව පාර,
මිරිහාන, නුගේගොඩ.

***සැලකිය යුතුයි.*-** එකී පෙත්සම අඩගසනු ලබන අවස්ථාවේදී ඒ සඳහා පෙනී සිටීමට කැමැත්තක් දක්වන කිසියම් පුද්ගලයෙකු සිටී නම් එසේ කිරීමට තමාගේ ඇති කැමැත්ත පිළිබඳව පෙත්සම්කරුගේ ඉහත නම් සඳහන් ලියාපදිංචි නීතිඥවරයා වෙත ලිඛිතව භාර දිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. එම දැනුම්දීමේදී අදාළ පුද්ගලයාගේ නම සහ ලිපිනය සඳහන් විය යුතු අතර, එය සමාගමක් නම් සමාගමේ නම සහ ලිපිනය සඳහන් කර කිසියම් පුද්ගලයෙකු හෝ සමාගමක් විසින් අත්සන් තබා එසේ නොමැති නම් ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයා විසින් අත්සන් තබා

භාර දිය යුතුය. එසේ නොමැතිව තැපැල් කරන්නේ නම් ඉහත නම් සඳහන් අය වෙත කාලවේලා සහිතව ලැබෙන සේ 2022 මාර්තු මස 27 වැනි දින පස්වරු 6.00 ප්‍රථම (පස්වරු හය) එවිය යුතුය.

පෙත්සම්කරුගේ නීතිඥ.

ලක්ෂිකා රත්නායක ඇසෝසියේට්ස්,
අංක 16/2/1, පරණ කොට්ටාව පාර,
මිරිහාන, නුගේගොඩ.

03-26

---

**2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

මදුර විතානගේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතන (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තව, ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනයේ සිය නාමය ශ්‍රී ලංකා වරලත් බදුකරණ ආයතනය ලෙස වෙනස් කිරීම සහ ආයතනයේ නම වෙනස් කිරීමත් සමග අවශ්‍ය අනෙකුත් අනුරූප සංශෝධනය කිරීමය.

1. බදු නීතිය හා එහි ප්‍රායෝගික බව පිළිබඳව උපදෙස් ලබාදෙන තැනැත්තන් සඳහා වෘත්තීය ආයතනයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම,

2. සාමාජිකයන් සඳහා හෝ සාමාජිකයන් වීම සඳහා සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන් සඳහා පාඨමාලා නියම කිරීම හා පැවැත්වීම හෝ අනුමත කිරීම සහ අවශ්‍ය වෘත්තීමය සුදුසුකම් ප්‍රදානය කිරීම,

යනාදිය වේ.

මදුර විතානගේ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

2022 පෙබරවාරි මස 25 වැනි දින.

03-57

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **මාර්තු** | 2022.03.04 | සිකුරාදා | 2022.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.11 | සිකුරාදා | 2022.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.18 | සිකුරාදා | 2022.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.25 | සිකුරාදා | 2022.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2022.04.01 | සිකුරාදා | 2022.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.08 | සිකුරාදා | 2022.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.12 | අඟහරුවාදා | 2022.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.22 | සිකුරාදා | 2022.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.29 | සිකුරාදා | 2022.04.12 | අඟහරුවාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2022.05.06 | සිකුරාදා | 2022.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.13 | සිකුරාදා | 2022.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.20 | සිකුරාදා | 2022.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.27 | සිකුරාදා | 2022.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.